# පුල්එළිය ග්‍රාමයෙ හි නූතන ශ්‍රම සංවිධානය

**ඓ**තිහාසික මෙන්ම පෞරාණික වශයෙන් ද හෙබි පුල්එළිය ගම්මානය කෘෂිකාර්මික ගම්මානයකි. වර්තමානය වන විට කෘෂිකර්මාන්තයට අමතරව වෙනත් ආර්ථික ක්‍රියාකාරකම් ගම තුළ සිදු වුව ද, කෘෂිකර්මාන්තය වර්තමානයටත් එහි මූලික ජීවනෝපාය මාර්ගයයි. කෘෂිකර්මාන්තය වූ කලී ශ්‍රමය විශාල වශයෙන් අවශ්‍ය වූ කර්මාන්තයකි. දියුණු රටවල ශ්‍රමය අඩුවෙන් භාවිතා වී යාන්ත්‍රික ක්‍රමයන්ට ළඟා වී ඇතත් සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාව තුළ ශ්‍රමයට මුල් තැනක් හිමි වේ. යාන්ත්‍රීකරණය මෙම ගම්මානයේ ද දක ගැනීමට හැකිය. බොහෝ වගාවල බිම් සැකසීම, අස්වනු නෙළීම (වී වගාව) වැනි කටයුතු යාන්ත්‍රීකරණය වී ඇතත් මිනිස් ශ්‍රමය බහුලව භාවිතා වේ.

මිනිස් ශ්‍රමය භාවිතා වන ආකාරය සොයා බැලීමේ දී අතීතයේ පැවති ශ්‍රම සංවිධානයේ මූලික හරය වූයේ "**කයිය**"යි. "කයිය" යනු ගමෙහි එක් පුද්ගලයෙකුගේ අවශ්‍යතාවයක් පවතින විට ගමෙහි සියලු දෙනා පාහේ ගොස් ඔහුගේ එම කාර්යය ඉටු කර දීම යි. ඊ ළඟ දවසේ තවත් පුද්ගලයෙකු ගේ කාර්යයක් ඉටු කිරීමයි.

උදහරණ වශයෙන් A නම් පුද්ගලයාගේ අද දින අස්වනු නෙළයි නම් සියලු දෙනාම එයට සහභාගී වී සහයෝගයෙන් එය සිදු කරනු ලබන අතර ඊළඟ දිනයේ තවත් කෙනෙකුගේ අස්වනු නෙළීමේ කාර්යයට සියලු දෙනා සහභාගී වේ.

වර්තමානයේ දී, මෙම "කයිය" ක්‍රමය ක්‍රියාත්මක නො වේ. මෙයට ප්‍රධාන හේතුව නම් අසමගිය ගම තුළ වර්ධනය වීමයි. මෙයට අමතරව ආර්ථික වශයෙන් තරඟකාරීත්වය වර්ධනය වීම ද බලපා ඇත. එකිනෙකාට උදව් කරනවා වෙනුවට, එකෙකු පරයා අනෙකා නැඟී සිටීමේ ආකල්පය මත එකිනෙකා අතර තරඟකාරීත්වය මතු වී තිබේ. මේ හේතුව මත, තම තමන් පෞද්ගලිකව ශ්‍රමය යොදා ගෙන වගා කටයුතු සිදු කිරීම දක ගත හැකිය. එසේම, එකිනෙකා අතර පැවති අන්‍යෝන්‍ය විශ්වාසය බිඳ වැටීමට ද මෙය බලපා ඇත. කෙසේ වුව ද, ඇතැම් අවස්ථාවල අත්තම් ශ්‍රමය වර්තමානයේ දී පවා ක්‍රියාත්මක වේ. එම අත්තම් ක්‍රමයේ ද සුවිශේෂී ලක්ෂණයක් දක ගත හැකිය. බොහෝ විට මෙය ක්‍රියාත්මක වන්නේ ළඟම ඥාතීන් හෝ ළඟම හිතවතුන් අතර වේ. ඒ අනුව, ශ්‍රම සංවිධානය බිහිවීම සඳහා ඥාතීත්වය සහ විශ්වාසය පදනම් වී තිබේ.

වගා කටයුතු සඳහා කුලී ශ්‍රමය ද බහුලව යොදා ගැනේ. බොහෝ දුරට කුළියට ශ්‍රමය ලබා ගැනීමේ දී ගම තුළින් ම ශ්‍රමය සපයා ගනු ලැබේ. ඊට අමතරව ගමට පිටතින් ද ශ්‍රමය ලබා ගන්නා අවස්ථා පවතී. කලවැල්-පොතාන සහ තුලාවෙල්ලිය යන ගම් දෙක මෙහි දී වැඩිපුරම ශ්‍රමය ලබා ගන්නා ගම් දෙක බවට පත්ව තිබේ. එම ශ්‍රම සපයා ගැන්ම තුළ ද සුවිශේෂී ලක්ෂණයක් දක ගත හැකිය. එනම්, කාන්තා ශ්‍රමය ලබා ගැනීමට වැඩි අවධානයක් යොමු වීම ය. එයින් පිරිමි ශ්‍රමයට ඇති ඉල්ලුම අඩු යැයි අර්ථවත් නො කෙරේ. කෙසේ වුව ද, ගැහැණු ශ්‍රමය සඳහා ගෙවිය යුතු මිල අඩු නිසා ගැහැනු ශ්‍රමය ලබා ගැනීමට ගොවි මහතුන් වැඩි කැමැත්තක් දක්වනු ලබයි. එසේ වුව ද, වගා කටයුතුවල කැලෑ කෙටීම, බිම් සැකසීම, වී වගාවේ නියරවල් රැකීම, බැඳීම වැනි කාර්ය කිරීමේ දී පිරිමි ශ්‍රමයට වැඩිපුර ඉල්ලුමක් පවතී. එයට හේතුව, එම කටයුතු කිරීමට දැඩි ශක්තියක් අවශ්‍ය වන නිසාය. මෙහි දී, විශාල වශයෙන් ශක්තියක් බලයක් අවශ්‍ය නොවන

අස්වනු නෙළීම වැනි කටයුතු සඳහා කාන්තා ශ්‍රමය බහුලව යොදා ගනු ලබයි. එසේම, ගම තුළ ශ්‍රම හිඟයක් පවතින ආකාරයක් ද දක ගත හැකිය. මෙයට බල පෑ ප්‍රධාන සාධකය නම් තරුණ පරපුර ක්‍රමයෙන් කෘෂි කර්මාන්තයෙ හි නියැළීම අඩුවීමයි. මෙයට බලපා ඇති තීරණාත්මක සාධකය වී තිබෙන්නේ තරුණ පරපුර මාසික වැටුප් ලැබිය හැකි රැකියාවලට යොමු වීමයි. මෙම රැකියා අතර ප්‍රධාන වන්නේ ආරක්ෂක අංශවල සේවා නියුක්තියයි. සිවිල් ආරක්ෂක සේවය, යුධ හමුද සේවය සහ නාවික හමුද සේවය මේ අතර ප්‍රධාන තැනක් ගනී. ඇතැම් පවුල්වල පවුලේ සියලු දෙනාම ආරක්ෂක අංශයේ රැකියාවලට යොමු වී සිටිති. මේ නිසා, ගමේ කෘෂිකර්මාන්තය තුළ ශ්‍රම හිඟයක් මතු වී තිබේ.

මෙයට අමතරව තරුණ පරපුර කෘෂිකර්මාන්තයට දක්වන ඇල්ම අඩුවීම හේතු කොට ගෙන ඔවුහු විවිධ රැකියා ක්ෂේත්‍රවලට යොමු වී සිටිති. විශේෂයෙන්ම, පෞද්ගලික අංශයේ රැකියා සඳහා විශාල පිරිසකගේ යොමු වීමක් පවතී.

උදහරණ වශයෙන් මැදවච්චියේ Consulting Engineer and Contractors (Pvt) Ltd (CEC) ආයතනය තුළ සැලකිය යුතු පිරිසක් රැකියාවේ නියුක්තව සිටිති. එයට අමතරව ඇඟලුම් කර්මාන්තයේ සහ වෙනත් පෞද්ගලික ආයතනවල සේවය කිරීමේ අරමුණින් සැලකිය යුතු පිරිසක් කොළඹ ප්‍රදේශයට සංක්‍රමණය වී සිටිති.

මේ හේතු සාධක නිසා වගා කටයුතු කිරීම සඳහා පවුලේ ශ්‍රමය ප්‍රමාණවත් නොවන තත්ත්වයක් මතු වී තිබේ. එබැවින්, ශ්‍රමය මුදලට ලබා ගැනීමට ගොවීහු පෙළඹී සිටිති.

ශ්‍රම සංවිධානයේ තවත් ලක්ෂණයක් නම් ළමා ශ්‍රමය ද වගා කටයුතුවලට භාවිතා කිරීමයි. ළමා ශ්‍රමය භාවිතා කිරීමේ දී ද, සුවිශේෂී ලක්ෂණයක් දක ගත හැකිය. එනම්, පිරිමි ළමා ශ්‍රමය යොද ගැනීම, කාන්තා ළමා ශ්‍රමයට සාපේක්ෂව ඉහළ අගයක් ගැනීමයි. ගමෙහි සිටින ගැහැණු ළමයි බොහෝ විට ඔවුන්ගේ අධ්‍යාපන කටයුතුවල නිරතවීම දක ගත හැකි වුව ද පිරිමි ළමුන්, ගැහැණු ළමයින්ට සාපේක්ෂව අධ්‍යාපන කටයුතුවල නිරතවීම අඩු ය. විශේෂයෙන් ම වී වගා කටයුතුවලට යාන්ත්‍රීකරණය ඇතුලුවීමත් සමඟ එම යන්ත්‍ර සූත්‍ර හැසිරවීමේ ආශාව මත කුඩා ළමුන් පවා වගා කටයුතුවලට සහාය දක්වීමට යොමු වීමක් දක ගත හැකිය. උදහරණ ලෙස ට්‍රැක්ටර් හැසිරවීමට ඇති කැමැත්ත. ගැහැනු ළමයින් වගා කටයුතු සඳහා බොහෝ විට යොමු වන්නේ විවාහයෙන් පසුව ය. විවාහයට පෙර තම දෙමාපියන්ගෙන් යැපීමේ වැඩි ප්‍රවණතාවයක් පෙන්නුම් කළ ද, විවාහයෙන් පසු තම ස්වාමිපුරුෂයා සමඟ සහයෝගයෙන් වගා කටයුතු සිදු කරන බවක් දක ගත හැකිය. එයට හේතුව, පවුල තුළ වගා කටයුතුවල දී පිරිමි ළමුන්ට සාපේක්ෂව ගැහැනු ළමයින්ට ඇති වගකීම අඩුවීමයි. මෙහි දී විවාහයක් වී, වෙනම පවුලක් බවට පත් වූ විට කාන්තාවට මුල් පවුලේ තිබූ වගකීමට වඩා වැඩි වගකීමක් පැවරේ. එම නිසා, කාන්තාව විවාහයෙන් පසු සක්‍රීය දයකත්වයක් වගා කටයුතුවල දී දක්වනු ලබයි. ඇතැම් පවුල්වල කාන්තාවෝ වගා කටයුතුවල දී සක්‍රීය දයකත්වයක් නො දක්වති. එසේ වුව ද, පවුල් සියයක් අතුරෙන් එයින් අනූවකට වඩා වැඩි ප්‍රතිශතයක කාන්තාවන් වගා කටයුතුවල දී සක්‍රීයව දයක වේ.

**අජිත් මානගේ**
**විමර්ශක**
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය